# ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය

ඩී. එස්. සේනානායක පාර, කොළඹ 05, ශ්‍රී ලංකා.
දුරකථන / ෆැක්ස් : 2556629 වෙබ් අඩවිය : www.slpia.lk ඊ-මේල් : slpia@sltnet.lk

මගේ අංකය : එස්.එල්.පී.අයි.ඒ/බැහැර/110/20 ඔබේ අංකය :

2020.06.30

සී.ඩී. වික්‍රමරත්න මහතා,
වැඩබලන පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

**කොවිඩ් - 19 වසංගත තත්ත්වය සාර්ථකව මැඩලීම සඳහා ගනුලැබූ දූරදර්ශී ක්‍රියා පිළිවෙත වෙනුවෙන් ස්තුතිය පිරිනැමීම.**

ගෝලීය වසංගතයක්ව පවතින කොවිඩ් - 19 වසංගත තත්ත්වය ශ්‍රී ලංකාව තුල පාලනය කර ගැනීම වෙනුවෙන් ඔබතුමාගේ දූරදර්ශී නායකත්වය සහ ඍජු මගපෙන්වීම යටතේ ශ්‍රී ලංකා පොලිසිය වශයෙන් දියත් කරනු ලැබූ ක්‍රියා පිළිවෙත වෙනුවෙන් අප සංගමයේ හෘදයාංගම කෘතවේදීත්වය පුදකර සිටින්නෙමු.

මෙම වසංගතය මැඩලීම වෙනුවෙන් ශ්‍රී ලංකා පොලිසිය මෙන්ම උරින්නුර ගැටෙමින් රාජකාරී කරනු ලැබූ ත්‍රිවිධ හමුදා නිලධාරීන් මෙන්ම ඔවුන්ගේ පවුල්වල සාමාජික සාමාජිකාවන්ද කොවිඩ් - 19 වසංගතයට ගොදුරුවිය. නමුදු ඔබතුමා විසින් සමස්ථ පොලිස් නිලධාරීන් හා ඔවුන්ගේ පවුලේ සාමාජික සාමාජිකාවන්ගේ ආරක්ෂාව වෙනුවෙන් දෙන ලද නිසි උපදෙස් හා නියෝග අනුව කටයුතු කිරීම තුලින් පොලිස් නිලධාරීන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජික සාමාජිකාවන් මෙම උවදුරින් ආරක්ෂා කර ගැනීමට හැකිවන ලදී. එය ඔබතුමාගේ ඍජු නායකත්වය හා දූරදර්ශී ක්‍රියා පිළිවෙතෙහි යහපත් ප්‍රතිඵලයකි.

තවද, කොවිඩ් - 19 වෙනුවෙන් ආරම්භ කරන ලද සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදල සඳහා ශ්‍රී ලංකා පොලිසිය වෙනුවෙන් දායකත්වය සැපයීම සම්බන්ධවද අප සංගමයේ කෘතඥතාවය පිරිනමන අතර, එය කාලීන අවශ්‍යතාවයක් වශයෙන් සලකන්නෙමු.

ඔබතුමාගේ රාජකාරි දිවියේ ඉදිරි කටයුතු සාර්ථක අයුරින් ඉටුකර ගැනීමට අවැසි ශක්තිය, ධෛර්ය හා ත්‍රිවිධ රත්නයේ ආරක්ෂාව ඔබතුමාවෙත ලැබේවායි අප ප්‍රාර්ථනා කරන්නෙමු.

ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමයේ විධායක කමිටුව වෙනුවෙන්,

ප්‍රගීත් ප්‍රේමසිරි,
නීතිඥ, නීතිවේදී (ගෞරව),
පොලිස් පරීක්ෂක,
ලේකම්,
පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය.

නීතිඥ ප්‍රගීත් ප්‍රේමසිරි
නීතිවේදී (ගෞරව)
ගරු ලේකම්.
ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය.

අභිමානවත් පොලිසියක් ගොඩනගමු.